**පන්නල ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පන්නල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පන්නල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු ජල බවුසරයේ තක්සේරු වටිනාකම රු.950,000ක් වුවත්, එය රු. 450,000ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.. | 2023 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | රු.138,750ක් වටිනාකමැති පියෙස්ට්‍රා වර්ගයේ වානේ අල්මාරි 3ක්, ප්ලාස්ටික් පුටු 25ක්, රු.333,805ක් වටිනාකමැති යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 15ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ගෑස් තොගයේ වටිනාකම රු.71,243ක් ජර්නල් සටහන් 59 සහ 60 මගින් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | ගබඩා තොග නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 16ක මූල්‍ය ප්‍රකාශන අනුව හා උපලේඛන අතර එකතු වටිනාකම රු.98,695,020 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන වල පවත්නා ශේෂය උප ලේඛන වල පවත්නා ශේෂය නිවැරදි කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | නිවැරදිව ශේෂ හඳුනාගෙන ගිණුම් තැබීම කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව<br>-------------------- | අනුකූල නොවීම<br>-------------------- | සභාවේ අදහස් දැක්වීම<br>------------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | 371 රෙගුලාසිය | අදාළ කාර්යය නිමවූ විගස අත්තිකාරම් පියවිය යුතු වුවත් රු.329,564 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරියේ දී එම වරද නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | රු.4,483,759 ක කල් ඉකුත් වූ තැන්පතු 24 ක් නියාදනය කර නොතිබුණි. | -එම- | -එම- |
| (ආ) | 2022 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020<br>---------------------- | | | |
| | 8.1.1 වගන්තිය | වත්කම් මාරු කිරීමේ දී එදිනට අදාළ වත්කමෙහි වටිනාකම ඇතුළත් සම්පූර්ණ ලේඛනයක් සකස් කර යුතු වුවත් එසේ කර නොතිබුණි. | වත්කම්හි වටිනාකම ඇතුළත් සම්පූර්ණ ලේඛනයක් සකස් කර ගැනීමට අදාළ විෂය නිළධාරීන් දැනුවත් කරන ලද බව. | අදාළ චක්‍රලේඛයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.96,940,370 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම 84,242,735 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල්කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) | 2021 ඇස්තමේන්තුගත ආදායම | 2021 බිල්කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 15,362 | 13,932 | 14,257 | 2,562 | 15,523 | 11,974 | 11,803 | 3,025 |
| කුලී | 32,469 | 30,154 | 26,730 | 3,674 | 30,391 | 27,977 | 19,893 | 5,809 |
| බලපත්‍ර ගාස්තු | 1,551 | 956 | 996 | - | 1,661 | 853 | 853 | - |
| වෙනත් ආදායම් | 20,564 | 16,674 | 17,021 | - | 369,679 | 21,382 | 21,391 | - |
| එකතුව | 69,946 | 61,716 | 59,004 | 6,236 | 417,254 | 62,186 | 53,940 | 8,834 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 2022 දෙසැම්බර් 31 දිනට රු.2,562,508 ක හිඟ වරිපනම් හා බදු ශේෂයක් අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | වරිපනම් හා බදු හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරමින් සිටින බව. | හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| 2022 දෙසැම්බර් 31 දිනට රු. 2,961,693 ක හිඟ කුලී ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | හිඟ කුලී මුදල අය කර ගැනීම සඳහා මාසික ආදායම් වැඩසටහන් පවත්වා ක්ෂේත්‍රයේ අය කිරීම් කටයුතු සිදු කරන බව. | හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.10,192,722 ක් හා මුද්දර ගාස්තු රු.219,324,293 ක් විය. | 2022.12.31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| | - | |
| **අතුරු ව්‍යවස්ථා** | | |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 20 ක් වෙනුවෙන් සභාව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ආවරණය නොවන කරුණු සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පැනවීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරන බව. | සභාවට ආදායම් උපයා ගැනීමට හැකි අවස්ථා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජෙනරේටරයක් මිලදී ගැනීම සඳහා 2020 වර්ෂයේ අයවැය මඟින් මුදල් වෙන්කර, 2022 වර්ෂයේ දී මිලදී ගැනීමට මිල ගණන් ඉදිරිපත් කළ ආයතන 08 අතරින් ආයතන 03ක් සැලකිය යුතු ප්‍රතිචාර නොදක්වන බව දක්වා ඉවත් කර, ඉවත් කළ මිල අතුරින් අඩුම මිලට වඩා රු.484,500ක් වැඩි වටිනාකමට පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල ඩීසල් ජෙනරේටර් යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාළ කටයුතු සිදු කළ ද මිලදී ගැනීමෙන් පසු සුපර් ඩීසල් යොදා එම යන්ත්‍රය ක්‍රියාත්මක කළ යුතුව පැවතුණි. තවද ප්‍රසම්පාදනයෙන් බැහැරව 2022 මාර්තු 21 දින අංක 597 දරන ගෙවීම් වවුචරයෙන් රු.1,091,610ක මුදලක් වැය කර මිලදී ගත් ආයතනය මඟින් ජෙනරේටරය සවිකර ගෙන තිබුණි. | මෙම යන්ත්‍රය ගෙන්වීම සඳහා තීන්දු තීරණ ගෙන තිබුණද විදුලි සැපයුම් උපාංග පිළිබඳව එම මිල ගණන් වලට ඇතුළත් කර නැත.යන්ත්‍රය ස්ථාපිත කළ පසු එය පණ ගැන්වීම ප්‍රමාද වීමෙන් වගකීම් කාලය ඇතුළත යන්ත්‍රයේ ඇතිවිය හැකි දෝෂ හඳුනාගෙන ඒ සඳහා පිළියම් යෙදීමට ද අදාළ ආයතනයේ සේවාව ලබා ගැනීමේ හැකියාව ද අපහට නොලැබී යාමට ඉඩ තිබුණු බව. | ප්‍රසම්පාදනය නියමිත ක්‍රමවේදය අනුව සිදු කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05ක වටිනාකම රු.228,772,941ක් වූ අතර, කාල විශ්ලේෂණයට අනුව වසර 01 සිට 05 දක්වා කාලයට අදාළ ශේෂ එකතුව රු.225,091,708 ක් වූ අතර වසර 5ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් එකතුව රු.169,374 ක් විය. | 1988 සිට 2011 දක්වා කාලය තුළ පියවූ බවට සාක්ෂි නොමැති අත්තිකාරම් ශේෂයක් ඇතුළත් වී ඇති බැවින් ඒ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර බලා අදාළ නිවැරදි කිරීම් ඉදිරියේ දී සිදු කරන බව. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ අයිතම 06ක එකතු වටිනාකම රු.346,812,351 ක් වූ අතර කාල විශ්ලේෂණය අනුව වසර 01 සිට 05 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.291,821,628 ක් වූ අතර වසර 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.50,000 ක් වී තිබුණි. | තවදුරටත් ගෙවිය යුතු මුදල් පිළිබඳ කරුණු සොයා බලා එම මුදල් ගෙවීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ආපසු ගෙවිය යුතු තැන්පත් රු.54,940,722ක ශේෂය සඳහා කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කාල විශ්ලේෂණය ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | කාල විශ්ලේෂණය විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | 2019 ජනවාරි 20 දිනැති වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2019/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 3 කට වරක් කඩකාමර කුලිය තක්සේරු කළ යුතු වුවද, සභාව සතු බදුකුලී පදනම මත ලබාදී තිබූ කඩකාමර 19 ක් සම්බන්ධව එසේ කර නොතිබුණි. | මෙම සභාව සතු වෙළඳ සංකීර්ණ හා කඩකාමර සඳහා මාසික කුලී තක්සේරු ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුණ ද පසුගිය කාලය තුළ පැවති රටේ තත්ත්වය මත තක්සේරු කටයුතු ප්‍රමාද වූ බව. | නව තක්සේරුවක් සිදුකර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාවේ රාජකාරිවල නිරත නොවන සේවකයින් 16 දෙනෙකුගෙන් රු.224,744 ක අයවිය යුතු ණය ශේෂයක් පැවතුණි. | නිළධාරීන්ගෙන් මේ වන විට අය කර ගැනීමට කටයුතු කරමින් සිටි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි වත්කම් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ලී බඩු හා සවිකිරීම් වත්කම් වලට අදාළව ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | වත්කම් වලට අදාලව ලේඛනයක් පවත්වාගෙන යාමට අදාළ උපදෙස් විෂය නිළධාරීන් දැනුවත් කර ඇති බව. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතුය. |
| (ආ) | සභාව සතු ජීප් රථය හා වෑන් රථය පවරා ගෙන නොතිබූ අතර සුසාන භූමි 121න් සුසාන භූමි 75 ක් සඳහා පැවරුම් නියෝග ලබාගන නොතිබුණි. | සභාව වෙත පවරා ගැනීමට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නුගේගොඩ සිංහ සමාජය විසින් 2005 වර්ෂයේ දී පරිත්‍යාග ලෙස සභාවට ලබා දී තිබූ වටිනාකම රු.5,000,000ක් වූ නිශාන් වර්ගයේ ගිනි නිවන රථය සහ වටිනාකම රු.1,500,000ක් වූ ස්කැවේටර් රථය 2023 අප්‍රේල් 20 දින වන විටත් උපකාර්යාල පරිශ්‍රයක නිශ්කාර්යව පැවතුණි. | ධාවනය සඳහා සුදුසු තත්ත්වයේ නොමැති නිසාන් වර්ගයේ ගිනි නිවන රථය හා ස්කැවේටර් රථය වෙන්දේසි කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව. | නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනමින් පියවර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආදායම් ශීර්ෂ 03 ක ඇස්තමේන්තුගත සහ ආදායම් අතර සියයට 35.3 සිට 66.8 දක්වා විචලනයක් ද වැය විෂයයන් 84ක සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40කට වඩා ප්‍රතිපාදන වැය නොවී විචලතාවයක් නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | රජය හා පළාත් පාලන ආයතනය මඟින් නිකුත් කළ උපදෙස් හා චක්‍රලේඛ අනුව සමහර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට සිදු වූ බව. | වසර මූල ආදායම් හා වියදම් සම්බන්ධයෙන් පුරෝකථනයක් සිදු කර අයවැය ලේඛනය සකස් කළ යුතුය. |